# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2183/28 - 2020 ජූලි මස 08 වැනි බදාදා - 2020.07.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : 6/3/7/15/7/7.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : LD/05/2007/MV/118.

මොරගහකන්ද/කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :*

මෙහි මහජන කටයුත්තක් යනු මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ, නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගඟල පල්ලේසිය පත්තුව අංක E.407C, මැදපිහිල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2020.04.27 දින සම්මත කරන ලද, අවසාන හුලක්ෂණාත්මක පිඹුරු අංකය 17, අතිරේක අංකය 37, පත්‍රය 95 දරන සැලසුමේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කොටස.

01. කැබලි අංක 3772
ඉඩමේ නම: වදුරුමුල්ලේයාය; විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මින්නේරිය-ගිරිතලේ වනජීවී රක්ෂිතය, අඹන හංදිය, කුඹියන්ගහඇළ, පරණගම පාර පදිංචි බටගල්ලේ ගෙදර රත්නායක විසින් අනවසරයෙන් භුක්ති විඳී; ප්‍රමාණය: හෙක්ටයාර් 0.5951.

02. කැබලි අංක 3773
ඉඩමේ නම: වදුරුමුල්ලේයාය; විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මින්නේරිය, ගිරිතලේ වනජීවී රක්ෂිතය, අඹන හංදිය, කුඹියන්ගහඇළ, පරණගම පාර පදිංචි බටගල්ලේ ගෙදර රත්නායක විසින් අනවසරයෙන් භුක්ති විඳී; ප්‍රමාණය: හෙක්ටයාර් 0.9748.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.08.12 වැනි දින පූ.භා. 9.00 ට නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2020.08.01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ආත්මා දිලුක්ෂි ජයරත්න,
ප්‍රාදේශීය ලේකම්,
නාඋල.

2020 ජූලි මස 03 වැනි දින,
නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 567

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ශුද්ධිපත්‍රයයි

2020.02.10 දින ගැසට් කරන ලද අංක 2162/13 දරන ගැසට් නිවේදනය හා සම්බන්ධවයි.

එම නිවේදනය මගින් පහත දැක්වෙන ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කීමට ඇති සියලු දෙනා වෙත ඉඩදී තිබූ කාලය පහත පරිදි සංශෝධනය කරමි.

ඒ අනුව පහත සඳහන් ඉඩම් වෙනුවෙන් හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.10.07 වැනි දින අ.භා. 2.00 ට හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 2020.09.30 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැන්විය යුතුය.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර :*

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ හතරලියද්ද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේ පළාත කෝරළේ අංක 350- හතරලියද්ද ග්‍රාම නිලධාරී වසමේ හතරලියද්ද ගමේ පිහිටි ඇල්පිටිවෙදේවෙල නමැති ඉඩම, (ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1391) සඳහා 2018.11.15 දින මැනුම්පති විසින් පිළියෙල කර ඇති අ.ග.පි. 204 හි අතිරේඛ 12 හි පත්‍ර අංක 10 හි කැබලි අංක 144, 145 වශයෙන් මැන වෙන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.1391 ක් වූ බිම් කොටස වේ.

01. **කැබලි අංක 144** – ඉඩමේ නම: ඇල්පිටිවෙදේවෙල; හිමිකම් කියන අය: විහාරාධිපති, දුංකුඹුර විහාරය, හතරලියද්ද; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1070.

*මායිම් :*

*උතුරට*: කැබලි අංක 28; *නැගෙනහිරට*: කැබලි අංක 28 හා 29; *දකුණට*: කැබලි අංක 29 හා 28; *බටහිරට*: කැබලි අංක 28, 23 සහ 143.

02. **කැබලි අංක 145** – ඉඩමේ නම: ඇල්පිටිවෙදේවෙල; හිමිකම් කියන අය: විහාරාධිපති, දුංකුඹුර විහාරය, හතරලියද්ද; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0321.

*මායිම් :*

*උතුරට*: කැබලි අංක 29 හා 28; *නැගෙනහිරට*: කැබලි අංක 28 හා 27; *දකුණට*: කැබලි අංක 28; *බටහිරට*: කැබලි අංක 28 සහ 29.

ඩබ්ලිව්. ජී. එම්. හේමන්ත කුමාර,
ප්‍රාදේශීය ලේකම්,
හතරලියද්ද.

2020 ජූලි මස 03 වැනි දින,
හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 566

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.